අරණායක ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සබරගමුව පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරන ලද කර්මාන්ත 09 කට අදාල සියයට 10 ක රැඳවුම් මුදල් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් රු.255,995 ක් බැගින් අඩුවෙන් දැක්වුණි.

(ආ) 2016 පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කළ කර්මාන්ත දෙකක නිමි වැඩ වටිනාකම රු.1,235,973 ක් වුවත් රු.1,300,000 ක් ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 64,027 ක් අඩුවෙන් හා 2016 දෙසැම්බර් 31 ට ණයහිමියෝ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) විනෝද බදු ලෙස සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු. 10,000 ක් තැන්පත් ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.10,000 ක් අඩුවෙන් හා 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සභාවේ සේවයේ නියුතු නිලධාරින් 36 දෙනෙකුට අදාල සේවක ඇප තැන්පතු රු. 157,983 ක් වුවත් එකී මුදල රු.163,323 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් හා ආපසු ගෙවියයුතු සේවක ඇප තැන්පත් රු. 5,340 ක් වැඩියෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.9,728,412 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.8,715,148 ක් වූයෙන් වෙනස රු.1,013,264 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

-----------------------

වසර 13 ක සිට ඉදිරියට එන රු.672,333 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

ලැබිය යුතු ගිණුම්

---------------------

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.4,054,877 ක් විය.

1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
---

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ.110 | සභාව විසින් හානි හා පාඩු ලේඛනයක් නඩත්තු නොකිරීම නිසා 2012 සිට 2015 වර්ෂය දක්වා සභාවේ වාහන 02 ක් , බැකෝ යන්ත්‍රය හා ආදාහනාගාරය පුපුරායාම හේතුවෙන් සිදුවූ හානි එකතුව රු.1,710,219 ක් හා සමාලෝචිත වර්ෂය තුළ සභාවේ කැබ් රථයට හා බැකෝලෝඩර් යන්ත්‍රයට සිදුවූ හානි පිළිවෙලින් රු.587,169 ක් හා රු.2,297,388 ක් හානි හා පාඩු ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 371 | 1999 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා අවස්ථා 07 කදී ලබාදෙන ලද වටිනාකම රු.45,683 ක් වූ අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි. |
| (iii) | මු.රෙ.1645 (අ) | සභාව සතු වාහන 15 කට අදාල ලොග් සටහන් පොත් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 1646 | සභාව සතු වාහන 04 කට අදාල ධාවන සටහන් ඉදිරිපත් කිරීමේදී මාස 08 සිට වර්ෂ 02 දක්වා ප්‍රමාදයන් හා වාහන 06 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයෙන් අපේක්ෂිත පරිදි සභාව සතු වාහන වල ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 9,011,086 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.9,930,290 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.919,204 ක පසුබෑමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.919,204 ක පසුබෑමට ආදායම් විෂයයන් 03 ක අඩුවීම හා වියදම් විෂයයන් 05 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | 2016.12.31 දිනට හිඟය | | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2016.01.01 දිනට පැවති හිඟය | වර්ෂයේ බිල්කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 820 | 567 | 2,633 | 2,455 | 253 | 178 | 431 |
| (ii) බදු කුලී | 319 | 44 | 73 | 73 | 275 | - | 275 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1 | - | 169 | 162 | 1 | 7 | 8 |
| (iv) වෙනත්ආදායම් | 13,281 | 7,662 | 38,963 | 25,573 | 5,619 | 13,390 | 19,009 |
| එකතුව | 14,421 | 8,273 | 41,838 | 28,263 | 6,148 | 13,575 | 19,723 |

2.3.2 ඉඩම් කැබලිකර විකිණීම මත ගාස්තු

---------------------------------------

සභා බල ප්‍රදේශය තුළ ඉඩම් කට්ටිකර විකිණීම මත අය කරනු ලැබූ රු.172,145 ක සියයට එකක් වූ ගාස්තු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.3.3 ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු මත ගාස්තු

---------------------------------------------

සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු වලින් වර්ග අඩියකට රු.50 බැගින් ගාස්තු අයකළ යුතු වුවත් ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 21 කින් රු.15,850 ක් අයකරගෙන නොතිබුණි.

2.3.4 හිග කඩකුලී

--------------

දිප්පිටිය පොදු වෙළඳපොලේ කඩකාමර 02 කින් අයවිය යුතු රු.5,838 ක හිග කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණ උසාවි දඩ රු.2,197,373 ක් හා මුද්දර ගාස්තු රු.14,085,124 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහන අළුත්වැඩියාවන් වලදී වාහන වලින් ගලවා ඉවත් කරන අබලි කොටස් හා වාහනවලින් ඉවත් කරන ටයර්, ටියුබ් හා බැටරි ආදිය විධිමත් පරිදි ලේඛනගත කර නොතිබුණි.

(ආ) සභාව සතුව පවතින වාහන 19 කට රියදුරන් 05 ක් පමණක් සිටීමෙන් වාහන ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) පළාත් පාලන අමාත්‍යාංශය , පළාත් සභාව ආදී විවිධ ආයතන වලින් හා ව්‍යාපෘති වලින් ලැබී තිබුණු රු.33,021,588 ක් වටිනා වාහන 11 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිප්පිටිය ආයුර්වේද බෙහෙත් ශාලාවේ අත්‍යවශ්‍ය ඖෂධ 22 ක් මාසයක කාලයක් පුරාවට නොතිබීම හේතුවෙන් රෝගී සත්කාරක සේවාව නිසි පරිදි ඉටු වී නොතිබුණි.

(ආ) 2015 අයවැය යෝජනා යටතේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන සඳහා රාජ්‍ය පරිපාලන ,පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍යාංශය ලබාදුන් රු.692,421 ක් අදාල කාර්යයන්ට වැය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභාව විසින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, සභා බල ප්‍රදේශය තුළින් එක් රැස් කරනු ලබන කැලිකසල පොල්අඹේගොඩ පොදු සුසාන භූමියේ පිහිටි වලකට බහාලීම සිදු කර තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය.

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය මඟින් වැය විෂයන් 05 ක් සඳහා සැලසූ එකතුව රු. 180,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් ද, වැය විෂයයන් 04 ක් සඳහා සැලසූ එකතුව රු.801,041 ක ප්‍රතිපාදන වලින් සියයට 40 සිට 98 දක්වා ප්‍රතිශතවලින්ද උපයෝජනය කර නොතිබුණි.

(ආ) ආදායම් ශීර්ෂ 4 ක ඇස්තමේන්තුගත ආදායමින් සියයට 72 සිට 88 දක්වා වූ එකතුව රු.294,449 ක ආදායම් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5 (7) රීතිය ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යාම නිසිබලධරයාගේ කාර්යයක් වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) තැන්පත් ලේඛන යාවත්කාලීන නොකිරීම<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම<br>(iii) පැරණි අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම |
| (ආ) අයවැය පාලනය | (i) වැය ප්‍රතිපාදන වල සැලකිය යුතු ප්‍රතිපාදනයන් ඉතිරිව තිබීම<br>(ii) ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම |
| (ඇ) ආදායම් පරිපාලනය | හිග ආදායම් අයකර නොගැනීම |
| (ඈ) වාහන පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම<br>(ii) වාහන ලොග් පොත් යාවත්කාලීන නොකිරීම<br>(iii) වාහනවල ඉන්ධන පරික්ෂාව සිදු නොකිරීම |